# බළන්ගොඩ නගර සභාව - ටෙන්ඩර් දැන්වීම

**බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට යාබදව ප්‍රචාරක පුවරු 15 ක් ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.**

බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටියට යාබදව දිග අඩි 07 x උස අඩි 2.5 දැන්වීම් පුවරු 15 ක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2026 සැප්තැම්බර් මස 03 වන දින සිට, 2027 අගෝස්තු මස 31 වන දින දක්වා වූ කාලය සඳහා බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ සභාපති නිකලන්ද වත්තේපේෂල තුෂාර ජයසේන වන මා විසින් 2026 සැප්තැම්බර් මස 01 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුළ දී නගර සභා කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබා ගත හැකිය.

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම:**

2026 අගෝස්තු මස 31 වන දින ප.ව.3.00 දක්වා ටෙන්ඩර්පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් භාර ගැනීම:**

2026 සැප්තැම්බර් මස 01 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ **සභාපති, බළන්ගොඩ නගර සභාව** යන ලිපිනයට 2026 සැප්තැම්බර් මස 01 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් විවෘත කිරීම:**

2026 සැප්තැම්බර් මස 01 දින පෙ.ව.10.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

**උපලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර් කැඳවනු ලබන දැන්වීම් පුවරුවේ නම හා අංකය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01. | බළන්ගොඩ ක්‍රීඩාපිටියට යාබදව දිග අඩි 07 x උස 2.5 ප්‍රමාණයේ දැන්වීම් පුවරු **15** ක් සවිකිරීම.(G-01 සිට G -15 දක්වා) | රු. 2,000.00 | රු.1,000.00 | රු.730.00 (එක් දැන්වීම් පුවරුවක් සඳහා පමණී) |

**විශේෂ කොන්දේසි:**

- ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදල හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- එක් ප්‍රචාරක පුවරුවකට හෝ කීපයකට පමණක් අයදුම්පත් ඉදිරිපත් කරන්නේනම් ප්‍රචාරක පුවරුවේ අංකය සඳහන් කර අයදුම්පත් ඉදිරිපත්කල හැකිය. ප්‍රචාරක දැන්වීම් පුවරු 15 සඳහාම එක් ලංසු කරුවෙකුට, අදාල ඇප තැන්පතු හා අයදුම්පත්‍ර ගාස්තු ගෙවා අයදුම්පතක් ඉදිරිපත්කල හැකිය.
- තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුළිය දැන්වීම් පුවරු බදුගත් අය විසින් 2026.09.03 දින අවසාන වන විට එකවර ගෙවා ගිවිසුම් අත්සන් කළ යුතුය.
- ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.
- ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම්පත්‍රය සමග ලබා දෙනු ලැබේ.

2026 අගෝස්තු මස 14 වන දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

එන්.ඩබ්.පී.ටී. ජයසේන
සභාපති
බළන්ගොඩ නගර සභාව.